(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 48.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 අප්‍රේල් 09 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

484/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති අරාබි විද්‍යාලවල සේවය කරනු ලබන ගුරුවරුන්ට විධිමත් පුහුණුවක් ලබා ගැනීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ඉගැන්වීම් කටයුතුවලට නිසි පුහුණුවීම් ලබාගැනීමේ හැකියාවක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මුස්ලිම් දේවස්ථානවල සේවය කරන ඉමාම්වරුන්ට සහ මුඅද්දීන්වරුන්ට විධිමත් පුහුණුවක් ලබා ගැනීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ඔවුන් විසින් ඉටු කරනු ලබන කටයුතු සඳහා නිසි පුහුණුවීම් ලබාගැනීමේ හැකියාවක් නොමැති බවත්;

යන්නත් එතුමා දන්නෙහිද?

(ඇ) අරාබි විද්‍යාලවල සේවය කරනු ලබන ගුරුවරුන්ට සහ මුස්ලිම් දේවස්ථානවල සේවය කරනු ලබන ඉමාම්වරුන්ට හා මුඅද්දීන්වරුන්ට විධිමත් පුහුණුවක් ලබා දීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

497/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සම්බන්ධයෙන් එම සංස්කෘතික මධ්‍යස්ථානවලින් සිදු කරනු ලබන ප්‍රධානතම කාර්යභාරය කවරේද;

(iii) පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තු යටතේ ඇති කලායතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම කලායතනවල කාර්යභාරය කවරේද;

(v) ලියාපදිංචි කර ඇති එහෙත් මේ වනවිට සක්‍රිය තත්ත්වයේ නොපවතින කලායතන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024 වර්ෂයේදී, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වන ලද වාර්ෂික සාහිත්‍ය උළෙල සඳහා රජය විසින් වැය කර ඇති මුළු මුදල කොපමණද;

(ii) සාහිත්‍ය උළෙල සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මුදල ප්‍රමාණවත් වන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

499/2025

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඊශ්‍රායල් රජය විසින් ශ්‍රී ලංකාව වෙත ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව කෘෂිකාර්මික, ඉදිකිරීම්, හෝටල් සහ නිෂ්පාදන යන එක් එක් අංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට රැකියා සඳහා ඊශ්‍රායලය වෙත යොමු කර ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) සියලු පරීක්ෂණ සමත්ව වෛද්‍ය වාර්තාද ලබා ගෙන වර්ෂයකට ආසන්න කාලයක් ගතවී තිබුණද අයදුම්කරුවන් 2400ක් පමණ මේ දක්වා ඊශ්‍රායල් රැකියා සඳහා යොමු කර නොමැති බව දන්නේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

(vi) ඔවුන් කඩිනමින් ඊශ්‍රායලයේ රැකියා සඳහා යොමු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

513/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වැව් අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

515/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මියගිය ජනතාව සිහිකිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලා තුළ රජය අපකීර්තියට පත්වන ආකාරයේ ප්‍රචාර සිදු කරන ලද බව දන්නේද;

(ii) සමාජ මාධ්‍ය ජාලා තුළ සංවිධානාත්මක ආකාරයෙන් ජාතිවාදය, ආගම්වාදය සහ ද්වේශ සහගත ප්‍රකාශ සිදු කිරීමට එරෙහිව මේ වනවිට බලපැවැත්වෙන නීතිමය ප්‍රතිපාදන කවරේද;

(iii) ඒ අතරින් පසුගිය කාලයේදී වැඩි වශයෙන් යොදා ගෙන ඇති පනත් කවරේද;

(iv) මාධ්‍ය මඟින් අසත්‍ය කරුණු ප්‍රචාරය වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිවැරදි සත්‍ය තත්ත්වය පිළිබඳව රජය විසින් කරනු ලබන පැහැදිලි කිරීම කඩිනමින් ප්‍රචාරය නොවීම හේතුවෙන් ඇති වන අපකීර්තිය වැළැක්වීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) මෙම තත්ත්වය නිවැරදි කිරීමට සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නැවත ඇති නොවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 7.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 24 දිනැති අංක 2429/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.04.08 දින ඉදිරිපත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 33 වගන්තිය යටතේ 2025.01.08 දින ඉදිරිපත් කරන ලද 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.02.28 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව (2023),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 153 වගන්තිය යටතේ 2025.01.24 දින ඉදිරිපත් කරන ලද 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.02.28 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2025.02.19 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව (2023),— 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ 2025.01.08 දින ඉදිරිපත් කරන ලද 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ආයුර්වේද වෛද්‍ය සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 20(2) වගන්තිය යටතේ 2024.12.17 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.12 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.15 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව (2022),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 23(4) වගන්තිය යටතේ 2024.12.17 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.12 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.15 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 20(2) වගන්තිය යටතේ 2025.02.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.12 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.15 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව (2023),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 23(4) වන වගන්තිය යටතේ 2025.02.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.12 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.15 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2019),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.02.28 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.04 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.12.18 දින ඉදිරිපත් කරන ලද 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.02.28 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.04 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.02.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.02.28 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.04 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තාව (2015/2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.01.08 දින ඉදිරිපත් කරන ලද 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2015/2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2020/2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.12.18 දින ඉදිරිපත් කරන ලද 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ 64 වගන්තිය යටතේ 2025.02.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනතේ 39 වගන්තිය යටතේ 2025.02.18 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව (2023),— 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනතේ 20 වගන්තිය යටතේ 2025.01.21 දින ඉදිරිපත් කරන ලද 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශිල්ප සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික වාර්තාව (2016),— 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9(4) වගන්තිය යටතේ 2025.02.05 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.12 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***